“රන් හෝ රිදී හිමි අයකු ඒ සඳහා වූ (සකාත්) නියමය ඉන් ඉටු නොකරන්නේ නම්, මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ ගින්නෙන් වූ තැටි ඔහු වෙනුවෙන් තනනු ලැබේ

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. “රන් හෝ රිදී හිමි අයකු ඒ සඳහා වූ (සකාත්) නියමය ඉන් ඉටු නොකරන්නේ නම්, මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ ගින්නෙන් වූ තැටි ඔහු වෙනුවෙන් තනනු ලැබේ. පසුව අපා ගින්නෙහි රත් කරනු ලැබ එමගින් ඔහුගේ ඇලපැත්ත ඔහුගේ නළල සහ ඔහුගේ පිට ගිනි තැටියෙන් මදිනු ලැබේ. එය සිසිල් වන සෑම විටෙකම නැවතත් රත් කරනු ලැබේ. මෙම දඬුවම වසර පනස්දහසක කාල ප්රමාණයකින් යුත් එක් මතු දිනයක සිදු වේ. තීන්දු දෙනු ලැබ, ස්වර්ගය වෙත හෝ අපා ගින්න වෙත හෝ ඔහුගේ මඟ ඔහු දකින තුරු නැවත නැවතත් ඔහු වෙනුවෙන් මෙසේ සිදු කරනු ලැබේ.” "අල්ලාහ්ගේ දූතයාණනි! එසේ නම්, ඔටු හිමියන් පිළිබඳ කුමක්ද?" යනුවෙන් විමසන ලදී. එතුමාණෝ: ඔටුවන් සතු අයකු ඒ සඳහා වූ නියමය ඔහු ඉන් ඉටු නොකරන්නේ නම් -ඌ කිරි දෙන දිනයේ උගේ කිරි දොවා (නිකුත් කිරීම ද) ඌ සතු නියමයක් වන්නේය.- මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ විශාල සහ සමතලා ස්ථානයක ඔහු විසිකරනු ලැබේ. ඔටුවන්ට බාධාවකින් තොරව පාගා දැමීම සඳහා එය වඩාත් ඉඩකඩ සහිත වනු ඇත. ඔහු සතු වූ සියළු ඔටුවන් ඔහු වෙත පැමිණ උගේ කුරවලින් ඔහුව පාගා දමා උගේ කටින් ඔහුව සපා කයි. උන්ගෙන් ප්රථම ඔටුවා ඔහු පසු කර ගිය සෑම අවස්ථාවකම උන්ගෙන් තවත් ඔටුවෙකු ඔහු වෙත නැවත යොමු කරනු ලැබේ. මෙම දඬුවම වසර පනස්දහසක කාල ප්රමාණයකින් යුත් එක් මතු දිනයක සිදු වේ. තීන්දු දෙනු ලැබ, ස්වර්ගය වෙත හෝ අපා ගින්න වෙත හෝ ඔහුගේ මඟ ඔහු දකින තුරු නැවත නැවතත් ඔහු වෙනුවෙන් මෙසේ සිදු කරනු ලැබේ.” "අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! ගව හා එළු හිමියා ගැන කුමක්ද?" යැයි විමසන ලදී. "ගවයන් හා එළුවන් හිමි පුද්ගලයා ඒවායෙහි නියමයන් ඔහු ඉන් ඉටු නොකරන්නේ නම් මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ විශාල සහ සමතලා ස්ථානයක ඔහු විසිකරනු ලැබේ. උන්ගෙන් කිසිවක් අඩු නොකරනු ඇත. එහි ඇඹුරුණු අං හෝ අං රහිත උන් හෝ ඇතුළතින් අං කැඩුණු සෑම සතකෙුම උන්ගේ අංවලින් ඔහුට අණින්නට ගනී. උන්ගේ කුර වලින් ඔහුව පාගන්නට ගනී. උන්ගෙන් ප්රථම සතා ඔහු පසු කර ගිය සෑම අවස්ථාවකම උන්ගෙන් තවත් සතෙකු ඔහු වෙත නැවත යොමු කරනු ලැබේ. මෙම දඬුවම වසර පනස්දහසක කාල ප්රමාණයකින් යුත් එක් මතු දිනයක සිදු වේ. තීන්දු දෙනු ලැබ, ස්වර්ගය වෙත හෝ අපා ගින්න වෙත හෝ ඔහුගේ මඟ ඔහු දකින තුරු නැවත නැවතත් ඔහු වෙනුවෙන් මෙසේ සිදු කරනු ලැබේ.”" යැයි පැවසුහ. "අල්ලාහ්ගේ දූතයාණනි! එසේ නම් අශ්ව හිමියා ගැන කුමක්ද?" යැයි විමසන ලදී. එතුමා: අශ්වයින් වර්ග තුනකි: ඌ විටෙක මිනිසාට බරකි. තවත් විටෙක ඌ මිනිසාට ආවරණයකි. තවත් විටෙක ඌ මිනිසාට කුසල් හිමි කර දෙන්නකි. මිනිසාට බරක් වන උන් වනාහි, ඉස්ලාම් වාසීන්ට එරෙහිව මිනිසකු විසින් මුහුණිච්ඡාව, උඩඟුකම සහ අපකීර්තිය උදෙසා බැද දමා තිබෙන සතුන්ය. උන් ඔහුට එය බරකි. ඔහුට ආවරණයක් වන උන් වනාහි, මිනිසකු විසින් අල්ලාහ්ගේ මාර්ගයේ ගමන් කිරීම සඳහා බැඳ දමා ඇති සතුන්ය. පසුව උන්ගේ පිටවල් හා බෙලි මත අල්ලාහ් නියම කළ නියමය ඔහු අමතක නොකළේය. උන් ඔහුට ආවරණයකි. ඔහුට කුසල් හිමි කර දෙන උන් වනාහි, මිනිසෙකු ඉස්ලාම් වැසියන් සඳහා තණ බිමක හෝ සරුසාර වත්තක හෝ ඌන් බැඳ දමා තිබෙයි. එසේ තණ බිමෙන් හෝ සරුසාර වත්තෙන් අනුභව කරන ප්රමාණයට ඔහුට යහපත ලියනු ලැබේ. උන්ගේ අසූචි හා රෝම ප්රමාණයට යහපත ලියනු ලැබේ. ඌ කඹය කඩා උස්

[متفق عليه] [صحيح]

ඔහුට කුසල් ලියන්නේමය. පසුව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගෙන් බූරුවා පිළිබඳ අසා ඌ අශ්වයාට සමාන වේදැයි විමසන ලදී. එවිට එතුමාණෝ, අද්විතීය විස්තීරණ වූ මෙම වැකිය මිස වෙනත් විශේෂ කිසිවක් ඌ සම්බන්ධයෙන් පහළ නොවූ බව පවසා සිටියහ. මෙය සියලුම වර්ග සඳහා ඔවුන්ගේ අවනතවීම හා පිටුපෑම යන්නෙහි පොදු නියමයකි. උත්තරීතර අල්ලාහ්ගේ එම ප්රකාශය මෙසේය: “එනම් කවරෙකු පරමාණුවක බරක් තරම් යහපතක් කරන්නේ ද එය ඔහු දැක ගනී. කවරෙකු පරමාණුවක බරක් තරම් නපුරක් සිදු කරන්නේ ද එය ද ඔහු දැක ගනී. (සූරා අස්-සල්සාල් 99: 7,8) බූරුවන් හිමිව තිබිය දී ඔහු අවනතව කටයුතු කර තිබුණේ නම්, එහි කුසල් ඔහු දකිනු ඇත. ඔහු පිටුපාමින් කටයුතු කර තිබුණේ නම් එහි විපාකය ද ඔහු දකිනු ඇත. මෙය සියලුම ක්රියාවන් සඳහා වූ පොදු කාරණාවකි.

http://sunnah.global/hadeeth/si/show/6611